# සරණෝපහාර

ශාසනකීර්ති ශ්‍රී උපහාරයෙන් පිදුම් ලබන
අධ්‍යාපනපති කාල්වානේ සරණංකර ස්වාමීන්ද්‍ර
## උපහාර ධර්මශාස්ත්‍රීය සංග්‍රහය




සංස්කාරකවරු
ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි
දර්ශනපති කුඩාකත්නෝරුවේ විනීත හිමි
ශාස්ත්‍රපති විතාරන්දෙණියේ චන්දසිරි හිමි

# ලේඛන ලේඛකාවලිය


1. චතුරාර්‍ය සත්‍යයේ පදනම 1
සම්මානිත මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ
B.A, (Hons), Ph.D (Lancaster)
හිටපු ශාස්ත්‍ර පීඨාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2. ආගම් ප්‍රචාරය හා බෞද්ධ ධර්මදූත සේවය 07
මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි
B.A., (Hons), Ph.D (Lancaster)
කුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

3. සමන්ගිර තරණය කළ විදේශීය සංචාරකයෝ 13
ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි
B.A. (Hons), M.A., Ph.D (Delhi)
අංශ ප්‍රධාන,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

4. ජතක කතා වලින් හෙළිවන පැරණි
භාරතයේ ජන ජීවිතය 22
මහාචාර්ය ටෙනිසන් පෙරේරා
B.A. (Hons), M.A., PGD in Sociology (Redding)
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

5. ශාන්ති කර්මයේ ප්‍රභවය හා විකාශය 31
මහාචාර්ය ආරියපාල පෙරේරා
B.A. (Hons), M.A., Ph.D (Baranesa)

6. ශ්‍රී ලංකාවේ අභිලේඛනවල භාවිතය චන්ද්‍ර
සංකේත සටහන් පිළිබඳ විමර්ශනයක් 45
මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි
B.A. (Hons), M.Sc. (Archaeology)
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

7. මානව අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ චින්තනය 57
ආචාර්ය පැලැන්වත්තේ ධම්මතිලක හිමි
B.A. (Hons), M.A., Ph.D (Kelaniya)

8. බෞද්ධ චින්තනය, සමාජය සහ
එහි ගවේෂණ ක්‍රමවේදය 64
ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රංජන්
B.A. (Hons), M. A., Ph.D (China),
PGDip in Education.,
PGDip in Bu. Philosophy, Dip in Chinese.,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

9. පරාරෝපන සංකල්පය පිළිබඳ සංදෘෂ්ටිකවාදී විග්‍රහය 73
යාපාරත්න වීරසේකර මහතා
B.A. (Hons), M.Phil (Jayewardenepura)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

10. සම්මුතියෙන් ඔබ්බට 82
ආචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි
Royal Pandit, B.A. (Hons), M.A., M.Phil., Ph.D (Delhi)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

11. පවුල් ඒකකය හා විවාහ ඒකකය සම්බන්ධ දාර්ශනික ආකල්ප — 98

අරුණ ශාන්ත වල්පොල
B.A. (Hons), M.A., (Sri Jayewardenepura)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

12. බෞද්ධ කායික සංරක්ෂණ විධි පිළිබඳ සංක්ෂිප්ත විමසුමක් — 104

ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
Royal Pandit, B.A. (Hons), M.A., Ph.D (Peradeniya)
කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

13. ථෙරවාද න්‍යායයෙහි අනන්‍යතාව පිළිබඳ විමසුමක් — 122

මුල්ඇඩියාවල අග්ගවංස හිමි
B.A. (Hons), M.A., (B.P.U)
සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

14. අධ්‍යාපන ඉතිහාසය: අග්ගඤ්ඤ සූත්‍රාගත විමසුමක් — 138

විතාරන්දෙණියේ චන්දසිරි හිමි
Royal Pandit, B.A. (Hons), M.A., Dip. in Education (Colombo)
සහය කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

15. සම්පත් ආයෝජනයේදී පැවතිය යුතු ආකල්පය — 146

කුඩාකත්නෝරුවේ විනීත හිමි
B.A. (Hons), M.A., M. Phil (Jayewardenepura)
සහය කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

16. ප්‍රාතිමෝක්ෂය හා විනය පිටකය අතර සබඳතාව
පිළිබඳ විමර්ශනයක් 156
පූජ්‍ය කඩිහිංගල හේමසිරි හිමි
B.A. (Hons), M.A., (Kelaniya)
කථිකාචාර්ය (ආධුනික)
බෞද්ධ හා පාලි අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.

17. අභිචාරවලින් හෙළිවන සෞඛ්‍ය මනෝ
විද්‍යාත්මක ප්‍රවණතා 166
නෙල්ලිවෙල මෙත්තානන්ද හිමි
B.A. (Hons), M.A., (Kelaniya), Dip. in Education (N.I.E)
සහය කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

18. හේතුඵලවාදී න්‍යාය මත පදනම් වූ සත්ත්වයාගේ
සසර පැවැත්ම හා නැවැත්ම කෙරෙහි
කර්මයේ බලපෑම 175
සංඛපාලේ පඤ්ඤාසාර හිමි
B.A. (Hons), M.A., (Kelaniya)
සහය කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

# බෞද්ධ චින්තනය, සමාජය සහ එහි ගවේශන ක්‍රමවේදය

ධර්මකීර්ති ශ්‍රී රන්ජන්

සමාජයෙහි දේව වාදය පිළිබඳ භක්තියෙහි අධ්‍යාත්මික ස්වරූප සහ එහි ක්‍රමවේදයන් හි සීමාවන් හා නො බැඳෙන බුද්ධිවාදී සමාජ දර්ශනයක ආචාරවාදී සමාජාගමනය සහ එහි පැහැදිලි සමාජ සංකල්පීයකරණය ප්‍රථම ධර්ම දේශනය තුළින් ඇරඹුණි. එහි දී දුක්ඛ සත්‍යාවබෝධයෙන් සක්කාය දිට්ඨියත්, සමුදය සත්‍යාවබෝධයෙන් උච්ඡේද දෘෂ්ඨියත්, නිරෝධ සත්‍යාවබෝධයෙන් ශාස්වත දෘෂ්ඨියත්, මාර්ග සත්‍යාවබෝධයෙන් අක්‍රිය දෘෂ්ටියත් බිඳවැටෙමින් හේතුඵල සබඳතාවය, පුනර්භවය, අනාත්මවාදය, ධර්මතාවය, අනීශ්වරවාදය ආදී දාර්ශනික සංකල්පීය කරුණු සහ එහි නියමානුකූලතාවන් පිළිබඳ, සමාජ මතවාදයෙහි ප්‍රතිඵල ලෙස විශාල බුද්ධි ප්‍රබෝධයක් නිර්මාණය වූ බැව් පෙනේ. බුද්ධිවාදී සමාජයක පසුබිම ශක්තිමත් කරන දාර්ශනික සහ විද්‍යාත්මක, සමාජමය තර්කය ලෝක බුද්ධි විෂයට ඇතුළත් කිරීම සහ එහි ක්‍රමවේදීය සමාජ භාවිතාවට මූල පිරිම ධම්මචක්කපවත්තන සූත්‍රයෙහි කේන්ද්‍රීය සංකල්පය විය (Thich, 1999). මේ අනුව බුදුදහමෙහි ආචාරවිද්‍යාත්මක බව අද්‍යතන සමාජ ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වය දක්වා සංකේන්ද්‍රණය වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි මූලික සමාජ සහ යථාර්ථීය ගති ලක්ෂණ හේතුවෙනි (කලංසූරිය, 1989). පාරම්පරික වෛදික හා උපනිෂද් ආගමික

තර්කය සහ විමර්ශන ක්‍රමවේදයන්ට වඩා බෙහෙවින් වෙනස්, මෙහි තර්කය සම්පාදනය වන්නේ අරිඅටඟි මග ඔස්සේ විමුක්තිය අරමුණු කොට ගෙන ය.

මිනිස් චින්තනයේ බෙහෙවින් උසස් ලෝක විෂය පිළිබඳ, අව්‍යාජ ප්‍රබුද්ධ අදියර පිළිබඳ සංකල්පය හා තර්කය සම්පාදනය වන මෙම බෞද්ධ දර්ශනයෙහි, ගැඹුර අප සමාජය තවමත් ස්පර්ශ නො කරන බැව් පැහැදිලි ය. සීල, සමාධි, ප්‍රඥා ආදී බුද්ධිමය පදනමට වඩා එහි ජනප්‍රිය ලක්ෂණ ස්වරූපයන්ට අනුගත කරන ආගමික කේන්ද්‍රීයභාවය තුළ බෞද්ධ දර්ශනය පිළිබඳ බෞද්ධ ප්‍රජාව අතරමැදි ස්වරූපයකට පත්ව ඇති බැව් පෙනේ. සචේතන අචේතන ආදී සෑම ගුණාංගයකටම අදාළ වන බෞද්ධ දර්ශනය මුළු ලෝකයේම හටගැන්ම, පැවැත්ම, පැවැත්මේ නැවැත්ම පිළිබඳ දර්ශනාත්මක සත්‍යයක් ලෙසින් සමාජ ගතවන්නට පටන් ගනු ලබයි. මෙය තණ්හාවෙන් මිදීම සහ නිවන අරමුණු කොට ගත් සුචරිතාත්මක මඟක් සහ ඒ හා සබැදි චර්යාත්මක දහමකි.

බුදු දහමේ මෙම දාර්ශනික අරුත අමතක කොට ආගමික දහමෙහි ස්වරූප සහ අරමුණු මූලික කරගනිමින් ප්‍රජාව පිළිබඳ බෞද්ධ කාර්ය බුද්ධිවාදයට සමීප නො වීමෙහි සමාජ ගැටලුව ඉතා ප්‍රබල ය. බුදුන් වහන්සේ දේශනා කොට වදාළ ආචාරාත්මක දහම කාලීනව මතුවන විවිධ අදහස්, මිත්‍යා කතා, අද්භූත කතා, සාහිත්‍ය ප්‍රබන්ධ ආදිය තුළින් අරුත් ගැන්වීම පිළිබඳ විද්‍යාත්මක හා න්‍යායාත්මක ගැටලු පවතී. එනම් වස්තු විෂය, සන්දර්භයට හා ප්‍රපංචයට උචිත ලෙස සංකල්ප සහ එහි ශිල්පීය ක්‍රම කේන්ද්‍ර කර ගැනීමක් හෝ ආදර්ශ තනමින් බුද්ධිමය ප්‍රවේශයක් මෙම සාහිත්‍ය භාෂණ තුළින් නිර්මාණය කරන බවක් නො පෙනේ. නැතහොත් වාස්තවිකව සමාජය කියවීමට අවශ්‍ය විඥානමය පදනම හේතුඵල තර්කන ක්‍රමවේදයට අනුව සමාජ කේන්ද්‍රීයභාවයකින් ගොඩ නො නගනු පෙනේ. මෙම සාහිත්‍ය විමර්ශන තුළ දී ස්වායත්ත, පරායත්ත විචල්‍ය පිළිබඳ මෙන් ම, නිගාමී, උද්ගාමී තර්කන ඇසුරින් විද්‍යාත්මක ක්‍රමවේදයෙ හි උපයෝගීතාවය තුළින් මනෝ

ප්‍රක්ෂේපණයක් (Mental Projection) සමාජ කේන්ද්‍රියව ගොඩ නැගිය හැකි ය.

බෞද්ධ දර්ශනයෙහි කේන්ද්‍රිය අරුතට වඩා සාහිත්‍ය හා ප්‍රබන්ධ මූලික වු බෞද්ධ සමාජ සංකල්පය ඉතා ප්‍රබල වී ඇති බව පැහදිලි ය (Robinson, 1997). මේ තුළින් සිදුවී ඇත්තේ බෞද්ධ දර්ශනයෙහි සාහිත්‍යමය ගුණය පිළිබඳ පුලුල් පදනමක් ගොඩ නැංවීම නො ව බුදු දහමේ මූලිකාංග පිළිබඳ අව්‍යාජ ක්‍රමවේදාත්මක ස්වරූපයනට ව්‍යාජ හා මිත්‍යාමය අදහස් ඔස්සේ පදනම සැකසීම යි. නිදසුන් ලෙස කර්ම, ධර්ම සංකල්ප ද සැලකිය හැකි ය. ලාංකීය ගිහි බෞද්ධ සමාජ ක්‍රමවේදය තුළ දාර්ශනික විමර්ශනයකින් තොර වන කර්ම සංකල්පය සියලු මානව හා සමාජ ක්‍රියාදාමයට ආරෝපණය කිරීම පුද්ගල අධ්‍යාත්මික සහ සමාජ සංවර්ධන ව්‍යායාමයෙහි තාර්කික නැඹුරුවට අතිශය අහිතකර වේ (Matthews,1986). මෙම උරුමය කෙටි කාලීන සමාජ හැඩගැස්වීමක ප්‍රතිඵලයක් නො ව දිගුකාලීන සමාජ ඓතිහාසික ගමනක ගොඩනැගුනු මානසික හා සමාජ ක්‍රියාවලියකි. අප සමාජයේ බොහෝ දෙනෙකු සියල්ල කර්මයට භාර දී මානසික නිදහස හෝ පරාරෝපිත ස්වභාවයට අනුගත වන්නේ එම ක්‍රියාවලිය මූලික බුදුසමයෙහි මූලිකාංග වලට එකඟ නො වන බව නො දන්නා බැවින් විය යුතු ය. කර්ම සංකල්පය යනු මෙලෙස සරල ක්‍රියාවලියක් තුළ විශ්ලේෂණය කළ හැකි මූලික බෞද්ධ ඉගැන්වීමක් නො වේ.

කාය සුචරිතය, වාක් සුචරිතය, මනෝ සුචරිතය සඳහා අප සමාජය තුළ ප්‍රබලව බලපාන කර්ම අරුතම තවදුරටත් ව්‍යාජත්වය මුසුවීම තුළ අතාර්කික අවබෝධයක මූලිකාංග සම්පූර්ණ කරන බව පෙනේ. උත්සාහය, උනන්දුව තුළ කර්මය වුව වෙනස් කරලීමේ හැකියාව පිළිබඳ බෞද්ධ ප්‍රජාවගේ මූලික අවබෝධය ඉතා සීමිත බව පැහැදිලි ය (Paul, 1984).

අරි අටඟි මග ඔස්සේ දියත් වන බෞද්ධ ආචාරාත්මක දර්ශනයේ පදනම නිවැරදි අධ්‍යාත්මික සහ නිවැරදි සමාජ කේන්ද්‍රික

ස්වරූපය නිර්වාණය යි. මෙම ක්‍රමවේදාත්මක ගමනට 1. දුක පිළිබඳ සත්‍ය නිවැරදිව දැනගැනීම 2. සමුදය සත්‍ය ප්‍රහානය කිරීම හා 3. නිරෝධ සත්‍යය අවබෝධ කොට ගැනීම යි. ඒ අනුව සත්‍යයේ ස්වරූපය සටහන් කිරීම, සත්‍යයේ භාවිතය සෙවීම, සත්‍ය කියමනක ලක්ෂණ විවරණය කොට දැක්වීම යනාදිය බුද්ධ දේශනාවේ ආවේණික ස්වරූප නො වේ. සත්‍ය සොයා ගනු ලබන්නේ බුදුන් වහන්සේම විසිනි. මෙහි ඇත්තේ ගවේෂණමය ලක්ෂණ යි. එනම් හේතු ප්‍රත්‍ය (Cause and Effect) සමවායෙන් හට ගන්නා ධර්ම පිළිබඳ ඍජුව බැලීමයි. ඒ අනුව මුලු විශ්වයම පටිච්චසමුප්පන්න බව පැහැදිලි වේ. පටිච්චසමුප්පන්න න්‍යායෙ හි නිරීක්ෂණ දත්ත (Observational Data) වන්නේ පටිච්චසමුප්පන්න ධර්මතා ය. පටිච්චසමුප්පාද ධර්ම වල නැති වීමක් සිදු නො වන අතර පුද්ගල සහ සමාජ කේන්ද්‍රීයව සහ ඒවා හි ග්‍රහණීය ස්වරූපයන් මත අඩු වැඩි වීම් දක්නට ලැබේ. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මත (Sensory Perception) ලෝක පටිච්චසමුප්පාදය ගවේශනය කළ හැකි ය. එය ගවේශනය කිරීමේ ශිල්පීය ක්‍රමවේදය (Methodology) බෞද්ධ දර්ශනයේ පෙන්වා දී තිබේ. එහෙත් බෞද්ධ සමාජය සහ එහි ක්‍රමවේදාත්මක ගමන ලෝක යථාර්ථීය ස්වරූප පිළිබඳ අවබෝධ කොට ගැනීම හෝ ගවේෂණ පරමාර්ථවලින් බැහැර වීමේ ගැටලුව ප්‍රබල ය. මෙහිදී ඔප් නංවනුයේ යම් කිසි ක්‍රියාවක් මිස තර්කයක් හෝ න්‍යායක් ඉදිරිපත් කිරීමක් නො වේ.

බෞද්ධ සමාජයෙ හි ආචාරවාදී සහ තාර්කික පදනම ගොඩ නැගෙනුයේ අරිඅටඟි මග වන යහපත් දැකීම, යහපත් කල්පනාව, යහපත් වචන, යහපත් කාය සුචරිතය, යහපත් ජීවන වෘත්තිය, යහපත් වීර්යය, යහපත් සිහි බුද්ධිය සහ යහපත් සමාධිය ඔස්සේ ය (Gethin, 1998). බෞද්ධ සමාජ දර්ශනයේ ඉතා ප්‍රබලතම සාරය මෙය යි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම තුළ ප්‍රබුද්ධ චින්තනයක් සහිත සම්භාව්‍ය සමාජයකට ප්‍රවේශ විය හැකි ය.

ඈත අතීතයේ සිට බිහි වූ ආගම්, දෘෂ්ටීන් හෝ ඇගයීම් වේවා මෑත භාගයේ බිහි වූ ඇගයුම්, දෘෂ්ටීන්, ආගම් හෝ වේවා

අනුගමනය කිරීමෙන් නූතන මිනිස් ජීවිතය හා සම්බන්ධ ගැටලු අවම වශයෙන් හෝ විසඳී ඇත්දැයි යන්න ගැටලුවකි. නිදසුන් ලෙස සෞභාග්‍ය, මිත්‍රත්වය, නිදහස, සොම්නස, සහෝදරත්වය, සැනසුම, මෝක්ෂය යනාදී වශයෙනි. අප සමාජය මේවායෙහි යථා ස්වභාවය තබා ඒවා තේරුම් ගත් බවක් වත් නො පෙනේ. මෙම වචනයන්හි අර්ථය සරල ප්‍රවේශයන් තුළ විශ්ලේෂණය කළ ද ඒවායෙහි ජනිත අර්ථය ඉතා ගැඹුරු ය. එය පුද්ගල සහ සමාජයේ අධ්‍යාත්මික ක්‍රියාවලිය හා බැඳුනක් මිස සමාජයෙහි මතු පිට පමණක් ස්පර්ශ කරන ජනප්‍රිය ක්‍රියාවලියක් නො වේ. නිදසුන් ලෙස සාමය හෝ මිත්‍රත්වය සැලකිය හැකි ය. මෙහි භෞතිකමය වශයෙන් ගොඩ නැගුණු සාම ක්‍රියාවලියකට වඩා පුද්ගල අභ්‍යන්තරය තුළ හෙවත් අධ්‍යාත්මික ක්‍රියාවලියක් ලෙස ගොඩනැගෙන සාමය අතිශය වැදගත් ය (Thich, 1992). එහෙත් අධ්‍යාත්මික සාමය, මිත්‍රත්වය හෝ සංවරය වර්තමාන සමාජ ක්‍රියාවලිය තුළ දැකිය හැකි ද යන්න ගැටලුවකි. පක්ෂ දේශපාලන ස්වරූපය තුළ සාමය, මිත්‍රත්වය, සෞභාගය, සැනසුම යනාදී වචන කරලියට ගෙන ඒමට ක්‍රියාකාරී වුව ද ඒවා සිද්ධි වාචක කියමන් බවට පමණක් පත් වී තිබේ. මාක්ස්වාදී ඉගැන්වීම තුළත් සමාජය ශක්තිමත් කරන පාදකය ආර්ථික සාධකය ලෙස පෙන්වා දෙයි. මතුපිට ව්‍යූහයේ පවතින්නේ අනෙකුත් සමාජ ක්‍රියාවලීන් ය. ඒ අනුව සෑම සමාජ දර්ශනයකම ඒ ඒ ක්‍රියාවලීන් ශක්තිමත් කරන ව්‍යූහයන් එහි ලක්ෂණ සහ ක්‍රියාත්මකතා පිළිබඳ විශ්ලේෂණ කොට තිබේ. බෞද්ධ දර්ශනයේත් පුද්ගලයා සහ සමාජ ක්‍රියාදාමය ශක්තිමත් කරන පාදකය හෙවත් අභ්‍යන්තරික ව්‍යූහය වන්නේ අධ්‍යාත්මය යි. මෙම අභ්‍යන්තරික ව්‍යූහය ශක්තිමත් කිරීමකට වඩා සමාජ ක්‍රියාවලියෙහි මතුපිට ව්‍යූහය තුළ ජනප්‍රිය ලක්ෂණ ගොඩ නැංවීම බුදු දහමේ හරාත්මක ගමනට විරෝධී වන අතර එය තණ්හාව හා මෝහය ප්‍රායෝගික කිරීමේ ක්‍රියාවලියකි.

අල්ලස, දූෂණ, වංචාව, හොරකම යනාදිය අප සමාජයේ කේන්ද්‍රීය ප්‍රපඤ්ච බවට ද පත්ව තිබේ. ඒවායෙහි ක්‍රමික වර්ධනය දැකිය හැකි ය. මෙවැනි සමාජ ගැටලු හා අධ්‍යාත්මික ක්‍රියා පිළිබඳ

සුලභව සාකච්ඡා කරනු ලබන්නේ මිනිස් සභ්‍යත්වය ද කිසියම් සන්ධිස්ථානයකට පැමිණි කාලයක ය.

සභ්‍යත්වය පිළිබඳ ඓතිහාසික විශ්ලේෂණයේදී එහි ප්‍රධාන සන්ධිස්ථාන ලෙස අත්ලාන්තික් සභ්‍යත්වය, මෙහෙන්දෝජාරෝ සභ්‍යත්වය, හරප්පා සභ්‍යත්වය, ඈත-කාම්බෝජ සභ්‍යත්වය, මායා සභ්‍යත්වය, ඇස්ටැක් සභ්‍යත්වය, බැබිලෝනියානු සභ්‍යත්වය යනාදිය සැළකිය හැකි ය. ඒ සියල්ලෙහි ගරා වැටීම පිළිබඳ ඓතිහාසික සාධක විවරණ කරති. වර්තමානයේ දක්නට ඇත්තේ බෞද්ධ, ක්‍රිස්තියානි, ඉස්ලාම්, හින්දු, යුදෙව්, මාක්ස්වාදී ආදී සභ්‍යත්වයන් ය. මේවායෙහි ද ඇගයුම් ලේඛන දෙදරා ගොස් ය. බෞද්ධ ඇගයුම් ලේඛනයේ ස්භාවය ද එය යි.

අරිඅටඟි මග හා බැඳි නිවහල් හා සරල සාරධර්ම හා ඇගයුම් පද්ධතීන්ගෙන් ඈත් වන ප්‍රජාව විකල්පීය ඇගයුම් හා සාරධර්ම පද්ධතීන්ට අනුගත වෙමින් පවතින බව පැහැදිලි ය. එනම් භක්තිවාදය යි. ඒ තුළින් බෞද්ධ සාරධර්ම පිළිගැනීමකට වඩා එහි දියව යාම ධෛර්‍යයමත් කරන ක්‍රියාවන්ගේ ස්ථාපිත වීම යි. කොතරම් බෞද්ධ දර්ශනයේ හරාත්මක ගැඹුර විශ්ලේෂණය කළත් ඉහත භක්තිවාදී ප්‍රජා සංස්කෘතික ස්වරූපය නිගමන වශයෙන් ඔවුහු ගම්‍ය කර ගනිති. මෙම සමාජ චින්තනයේ කේන්ද්‍රීය අරුත වන්නේ ප්‍රඥාව අරමුණු කොටගෙන ස්වකීය විමර්ශනයන් මෙහෙය වීම නො ව ආගමිකවාදය පදනම් කොටගෙන විමුක්තිය සෙවීම ය. මෙය බුද්ධි වශීකරණයක් යැයි කීම ද නිවැරදි ය. මේ තුළින් අප සමාජය ලබන්නේ බෞද්ධ ඇගයුම් ලේඛනයෙහි ප්‍රතික්ෂේපිත බවකි. ඒ අනුව වර්තමාන බෞද්ධ සමාජ ක්‍රමවේදය සමාජයට අරුම ගැටලු සමූහයක් බිහි කර තිබේ. බෞද්ධ දර්ශනයේ ක්‍රමවේදයත්, ජීවන ප්‍රතිපාදවත් සඳහා නිපුණතාවන් ලබනවා වෙනුවට පුද්ගලයාගේ අධ්‍යාත්මික සහ සමාජීය ජිවිතයෙහි පරාරෝපිත ස්වරූපයක් ගොඩ නැගී ඇති බැව් පැහැදිලි ය.

බෞද්ධ සමාජයේ ප්‍රබල ආකල්පීය වෙනසක් නිර්මාණය කළ යුතු කාලය දැන් එළඹ තිබේ. සමාජ ව්‍යුහය වෙනස ඊළඟ

පියවරයි. ප්‍රබල ආකල්පීය වෙනසකට කේන්ද්‍රගත වීම අවශ්‍ය වන්නේ 21 වන සියවස ඓතිහාසික සාධක ඔස්සේ නිරූපනය කරන සන්දර්භයක් කෙසේවත් නො සකසන බැවිනි. නව තාක්ෂණික සහ උසස් සංකල්පීයකරණ ප්‍රවේශ ඔස්සේ ගොඩනැගෙන අනාගත සමාජ ක්‍රමවේදය නූතන විද්‍යාත්මක ආදර්ශ ඔස්සේ තෙරුම් ගත යුතු වීම සුවිශේෂී වේ. මිනිස් චින්තනයේ බෙහෙවින් උසස්, අව්‍යාජ සහ ප්‍රබුද්ධ අදියරයන් නිර්මාණය කළ හැකි බෞද්ධ දර්ශනය අප සමාජයට නුහුරු එකක් නො වේ. මෙය තණ්හාවෙන් මුදවන ක්‍රමවේදය ඇතුළත් ආචාරවාදී දහමකි. ඒ අනුව අරුමෝසම් චින්තන ආකල්ප වලින් මිදී බෞද්ධ දර්ශනයේ ඇගයුම් ලේඛන තුළ සමස්ත සමාජ ක්‍රියාවලිය ගොඩ නැංවීම සිදු කළ යුතු ය.

බුදු දහමෙහි ඇතුළත් දේශපාලන විද්‍යාත්මක කරුණු, ආර්ථික විද්‍යාත්මක කරුණු, සමාජ විද්‍යාත්මක කරුණු, මානව හා මනෝවිද්‍යාත්මක කරුණු, ගැටලු සහ ඒවා නිරාකරණය කරන ක්‍රමවේද, සාමය පිළිබඳ කරුණු සහ එහි අධ්‍යාත්මික සාම ක්‍රියාවලියකට යා හැකි ප්‍රවේශ ආදී වශයෙන් කරුණු සංකල්පීයව සහ ප්‍රයෝගිකව සමාජ ගත කිරීමේ ක්‍රමවේද තවද සැකසීමේ කාලය එළඹ තිබේ. මෙම සංකල්පීය ස්වරූප පිළිබඳ දැනුම් සම්භාරයකින් තොරව සමාජ ව්‍යුහය, එහි ස්වරූප සහ ක්‍රියාකාරීත්වයන් හඳුනාගත නො හැකි වේ. සමාජය පිළිබඳ ගොඩනගන ඥානය සහ තර්කය නො මැති වන විට ඔහුගේ ආචාරාත්මක ස්වරූපයෙහි ගැටලු මතු වේ. නිදසුන් ලෙස ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි සඳහන් "සම්මා" යන වචනයෙහි අර්ථය සාධනය වන්නේ ද පුද්ගල සහ සමාජ ලෝකය තුළ ය.

බෞද්ධ දර්ශනය යනු මිනිසා පිළිබඳ දහමක් මිස භෞතික විද්‍යා විමර්ශන වල අඩංගු වන විශ්වය පිළිබඳ ඉලෙක්ට්‍රෝන, ප්‍රෝට්‍රෝන, නියුට්‍රෝන පිළිබඳ කථාවක් නො වේ. බුදු දහමේ පටිච්ච සමුප්පාදය හෙවත් හේතු ඵල දර්ශනය මිනිසාම කේන්ද්‍ර කොට ඇති විශ්වයේම ගැඹුරු දහමකි. හේතු ඵලත්වය යනු ඉපදී, නැසී

යන මිනිසා පිළිබඳ කේන්ද්‍රීය රීතිය වේ. අවිද්‍යාව නැමැති හේතුව නිසා සංස්කාර හට ගැනේ. හේතුව හා ඵලය අතර ඇත්තේ අවශ්‍ය සම්බන්ධයක් නිසා හේතුව පැමිණි විගස ඵලය පැමිණෙනු ඇත. බෞද්ධ දර්ශනයෙහි කරුණු සංකල්පීයව හා තර්කිකව අවබෝධ කර ගැනීම සහ එය වැඩී දියත් වන සන්දර්භය සහ පාවිච්චියේ ස්වරූප තේරුම් ගැනීම යනු පැහැදිලි චින්තනයක ආරම්භය යි. මෙම සංකල්පයන් හි අව්‍යාජ පාවිච්චිය හෝ භාවිතය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති විටක අපැහැදිලි විමර්ශන ඇතුළත් ව්‍යාජ ගැටලු නිර්මාණය නො වනු ඇත. බෞද්ධ දර්ශනයේ මූලික සංකල්ප නිවැරදිව භාවිතා වන්නේ නම් කිසිදු ගැටලුවක් හෝ මංමුලාවීමක් සමාජය තුළ ඇති නො වනු ඇත. සිතෙහි සසල වීමක් ඇති නො වේ. විනයකින් යුතුව සංකල්ප හැසිරවීම කළ යුතු වේ.

ඒ අනුව බුදු දහමෙහි ඥාන නැමැති සංකල්පය සමාජය හා සම්බන්ධ වෙමින් තණ්හාවෙන් මිදී විමුක්තිය දක්වාම ශක්තිමත් වන ප්‍රබල ක්‍රියාවලියකි. මෙය වික්‍රමයක් පිළිබඳ මානසික තත්වයක් ද වේ. එහෙත් බටහිර දර්ශනයට අනුව ඥානය යන්න සමාධියක් හෝ වික්‍රමයක් හෝ නො වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

කලන්සූරිය, ඒ. ඩී. පී. (1989). *දාර්ශනික චින්තන ධාරා, බුදු දහම,* වරකාපොළ, ආරිය ප්‍රකාශන.

Gethin, Rupert (1998), *Foundations of Buddhism,* Oxford University Press.

Matthews, Bruce.,(1986). *Post-Classical Developments in the Concepts of Karma and Rebirth in Theravada Buddhism, in Karma and Rebirth: Post-Classical Developments,* State Univ of New York Press.

Paul, James McDermott., (1984). *Development in the Early Buddhist Concept of Kamma*, Munshiram Manoharlal Publishers.

Robinson, Richard H. and Johnson, Willard L. (1997). *The Buddhist Religion.* Belmont, CA, Wadsworth Publishing Company.

Thich, Hanh Nhat., (1999). *The Heart of the Buddha's Teaching: Transforming Suffering into Peace, Joy, and Liberation*, Broadway Books.

Thich, Nhat Hanh., Bantam., (1992). *Peace Is Every Step: The Path of Mindfulness in Everyday Life,* Paperback.